(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 3(7).]

# පාර්ලිමේන්තුවේ අංක 3 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2021 මාර්තු 25 බ්‍රහස්පතින්දා**

---

**2021 අප්‍රේල් 5 සඳුදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

607/2020

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව ලබා දෙනු ලබන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දීමනාව ලබා ගැනීම සඳහා අයදුම් කර දැනට පොරොත්තු ලේඛනයේ සිටින සංඛ්‍යාව කොපමණද;

(iii) රජයේ "සෞභාගයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව, ජ්‍යෙෂ්ඨ පුරවැසි මාසික දීමනාව රු.2000.00 සිට රු. 2500.00 දක්වා වැඩි කිරීමට ක්‍රියා මාර්ග ගෙන තිබේද;

(iv) එසේ නම්, එම වැඩි කරනු ලබන දීමනාව ලබා දෙන දිනය කවරේද;

(v) විදේශ වන්දනා ගමන් සඳහා ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට අඩු පොලියට ණය ලබා දීමේ වැඩපිළිවෙළක් තිබේද;

(vi) එසේනම්, එය සම්බන්ධීකරණය කරනු ලබන ආයතන කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

726/2020

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල, පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ලග්ගල ප්‍රාදේශීය රෝහල අලුතින් ඉදිකිරීම සඳහා රජය විසින් වියදම් කර ඇති මුළු මුදල කොපමණද;

(ii) එම රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබා ගත හැකි රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iii) රෝහල සඳහා අනුමත වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වනවිට එම රෝහලේ සේවය කරන වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(v) රෝහල සඳහා අනුමත හෙද කාර්ය මණ්ඩලය කොපමණද;

(vi) මේ වනවිට එම රෝහලේ සේවයේ නිරත හෙද කාර්ය මණ්ඩලය කොපමණද;

(vii) දැනට එම රෝහලේ පවත්වාගෙන යනු ලබන සායන වර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

770/2020

ගරු මුජිබුර් රහුමාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොළඹ දිස්ත්‍රික්කයේ තිබෙන අර්ධ රාජ්‍ය පාසල් සිය අරමුණුවලට පටහැනිව යමින් අසල්වැසි ප්‍රදේශවල අඩු පහසුකම් සහිත ළමුන් බඳවානොගන්නා බව එතුමා දන්නෙහිද ?

(ආ) එසේනම්, කොළඹ දිස්ත්‍රික්කයේ එක් එක් අර්ධ රාජ්‍ය පාසැල සම්බන්ධයෙන්—

(i) පාසලේ නම කවරේද;

(ii) ආගමික හෝ ආගමික නොවන ලෙස වර්ගය කවරේද;

(iii) ජාතිය හා ආගම පදනම් කොට ඇතුලත් කර ගන්නා සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iv) එක ශ්‍රේණියේ සිට පහ ශ්‍රේණිය දක්වා අනුමත ඉංග්‍රීසි ප්‍රමුඛ කොටගත් ද්විභාෂික පංති සංඛ්‍යාව කොපමණද;

(v) අසල්වැසි ප්‍රදේශවල අඩු පහසුකම් සහිත ළමුන්ට වෙන්කොට ඇති කෝටාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත කී පාසැල් සම්බන්ධයෙන් —

(i) පළමු ශ්‍රේණියේ සිට පස්වන ශ්‍රේණිය දක්වා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පංති පැවැත්වීමට අවසර ලබාදී තිබේද;

(ii) පළමු ශ්‍රේණියට බඳවාගැනීම පිළිබඳ පොදු මාර්ගෝපදේශ අනුගමනය නොකළ හැක්කේ මන්ද;

(iii) පවත්නා ඇතුලත් කරගැනීමේ ක්‍රියාවලිය, විනිවිදභාවය හා කාර්‍යසාධනය පිළිබඳ රජය සෑහීමට පත්වන්නේද;

(iv) ඉගෙනුම් හා කළමනාකරණ ක්‍රමවේද විධිමත් කිරීමට රජය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

838/2020

ගරු ජේ.සී. අලවතුවල මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2019 අනුව, රජයේ සියලු විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් සාධාරණ අයුරින් වැඩි වී නොමැති බවත්;

(ii) ඒ හේතුවෙන් විශ්‍රාමිකයන් කළකිරීමට පත් වී ඇති බවත්;

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව අදියර පහක් යටතේ වැඩිවන අවසන් වැටුප මත විශ්‍රාම වැටුප් සැකසීමට නියමිතව තිබුණද, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2019 ට අනුව 2017.01.01 දිනට අදාළව අදියර දෙකක් යටතේ වූ වැටුප මත පමණක් විශ්‍රාම වැටුප සැකසීම හේතුවෙන් 2016.01.01 දිනට ප්‍රථම විශ්‍රාම ගන්වනු ලැබූ ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ, රණවිරුවන් ඇතුළු සියලුම රජයේ විශ්‍රාමිකයන්ට බලවත් අසාධාරණයක් සිදු වී ඇති බවත්;

(iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව අදියර පහක් යටතේ වැඩිවීමට නියමිතව තිබූ අවසන් වැටුප මත විශ්‍රාම වැටුප සැකසීමට කටයුතු කරන ලද්දේ නම්, 2020.01.01 දිනට ප්‍රථම විශ්‍රාම ලබාගත් රජයේ විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් වීමෙන් ඔවුන්ට සාධාරණයක් ඉටුවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 කඩිනමින් ක්‍රියාත්මක කර රජයේ විශ්‍රාමිකයන්ට සාධාරණයක් ඉටු කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

603/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 308 ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ආසිරිගම මාර්ගයේ කාගොල්ලෑව හන්දියේ සිට කටුකැලියාව හන්දිය දක්වා කිලෝ මීටර් 2 ක පමණ දුර ප්‍රමාණයකින් යුක්ත වූ කොටස ඉතාමත් අබලන් තත්ත්වයේ පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම මාර්ග කොටස අලුත්වැඩියා කිරීමට අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

635/2020

ගරු ශානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මඩකළපුව දිස්ත්‍රික්කයේ, පලුකාමම්, වීරච්චේනෙයි, මායාපුරම් සහ වන්නිනගර් යන ගම්මානවල ජීවත්වන ජනතාව පානීය ජල හිඟයකට මුහුණ දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගම්මානවල ජීවත්වන, උග්‍ර පානීය ජල හිඟයකට මුහුණ දී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්මානවල ජනතාවට පානීය ජලය ලබා දීම සඳහා ජල නල එළිය යුතු දුර ප්‍රමාණය කොපමණද;

(iii) මෙම ගම්මානවල පවතින පානීය ජල හිඟය විසඳීම සඳහා කඩිනම් පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

727/2020

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) එවකට බලයේ සිටි ජනාධිපතිවරයා විසින් 2013 ජනවාරි 15 අගවිනිසුරු ධුරයට ව්‍යවස්ථානුකූලව පත් කරන ලද මොහාන් පීරිස් මහතාගේ පත්කිරීම, පසුව අවලංගු හා බල ශූන්‍ය කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) මොහාන් පීරිස් මහතාගේ අගවිනිසුරු ධූරය සඳහා වූ එම පත්කිරීම, අවලංගු හා බලශූන්‍ය කර ඇත්තේ කවුරුන් විසින්ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

771/2020

ගරු මුජිබුර් රහුමාන් මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය සම්බන්ධයෙන් 2019.04.21 සිට සිය ගණනක් පුද්ගලයන් අත්අඩංගුවට ගෙන රඳවාතබා ගෙන සිටින බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම් 2019.04.21 දින සිට 2019.11.16 දින දක්වා සහ 2019.11.17 සිට මේ දක්වා කාලය තුළ—

(i) විමර්ශන සඳහා භාරයට ගත් සංඛ්‍යාව කොපමණද ;

(ii) රඳවාගැනීම් නියෝගය දීර්ඝ කරමින් රඳවාතබාගෙන සිටින සංඛ්‍යාව කොපමණද ;

(iii) චෝදනා පත්‍ර ගොනුකොට උසාවියට ඉදිරිපත් කළ සංඛ්‍යාව කොපමණද ;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද ?

(ඇ) (i) නිදහස් කොට, ඇප ලබාදී හෝ නිදොස් කොට ඇති පුද්ගලයන්ගේ නම් කවරේද;

(ii) පවතින විමර්ශන ක්‍රියාවලිය පිළිබඳව රජය තෘප්තිමත් වන්නේද;

(iii) සුළු චෝදනා මත රඳවා සිටින පුද්ගලයන් නිදහස් කිරීමටත්, දීර්ඝ කළ රැඳවුම් නියෝග මත සිටින සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් කිරීමටත් රජය පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

639/2020

ගරු රවුෆ් හකීම් මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වන සංරක්ෂණ ආඥා පනත අනුව යම් භූමියක් සංරක්ෂිත වනාන්තරයක් ලෙස ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කිරීමට සම්පූර්ණ විය යුතු මූලික අවශ්‍යතා කවරේද;

(ii) වන සංරක්ෂණ ආඥාපනත යටතේ මේ දක්වා ප්‍රකාශයට පත්කර ඇති රක්ෂිත වනාන්තර සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම එක් එක් වනාන්තරය, රක්ෂිත වනාන්තරයක් ලෙස ප්‍රකාශයට පත්කළ දිනය, එයට අයත් වන භූමි ප්‍රමාණය හා අදාළ සිතියම් පිළිබඳ සියලු විස්තර දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

729/2020

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කුරුණෑගල සිට ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හරහා දඹුල්ල දක්වා දුම්රිය මාර්ගයක් ඉදිකිරීමට සැලසුම් කර තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ඒ සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(ii) එම ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීමට නියමිත දිනය කවරේද;

(iii) එම ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට නියමිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

777/2020

ගරු අශෝක් අබේසිංහ මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පදිංචිව සිටින ඉඩම් ඔප්පු හිමිකම් නොමැති පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පවුල් සඳහා ඔප්පු ලබාදීමේ ක්‍රමවේදයන් සකස් කර තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රමවේදයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

839/2020

ගරු ජේ.සී. අලවතුවල මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ වනවිට විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් අතරින් කොවිඩ්-19 වෛරසය —

(i) ආසාදනය වූ;

(ii) ආසාදනයෙන් පසුව සුව වූ;

(iii) ආසාදනයෙන් පසු මරණයට පත් වූ;

(iv) හේතුවෙන් මේ වනවිට ශ්‍රී ලංකාවට පැමිණි;

ශ්‍රමිකයන් සංඛ්‍යාව ඔවුන් සේවය කරන රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත වෛරසය ආසාදනය හේතුවෙන් මේ වනවිට රැකියා අහිමි වූ විදෙස්ගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව ඔවුන් සේවය කළ රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ට සහන සැලසීමට ගත් ක්‍රියාමාර්ග කවරේද;

(iii) කොවිඩ්-19 ගෝලීය වසංගත තත්ත්වයට ගොදුරු වූ විදෙස්ගත ශ්‍රමිකයන් තම පවුල්වලට මුදල් නොඑවීමෙන් ආර්ථික අපහසුතාවයට පත් පවුල්වලට සහන සැලසීමට ගත් පියවර කවරේද;

(iv) එම වසංගතය හේතුවෙන් විපතට පත් විදෙස්ගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ සුභසාධනය සඳහා අදාළ රටවල තානාපති කාර්යාලවලට ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

877/2020

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සහ නීතිමය සීමාවන් ඉක්මවා යමින් ණය නිකුත් කිරීමට පෙර නීතිපතිවරයාගේ උපදෙස් ඉල්ලා සිටින ලද්දේ ද;

(ii) එසේනම්, නීතිපතිවරයාගේ උපදෙස් මත ගන්නා ලද ක්‍රියාමාර්ග කවරේද;

(iii) 2020 වර්ෂයේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සහ නීතිමය වශයෙන් නියම කර ඇති ණය ගැනීමේ සීමාව ඉක්මවා යමින් නිකුත් කරන ලද ණය ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද අනිකුත් ණය හා සමාන ලෙස ගෙවීම් පැහැර හැරීම පිළිබඳ සිදුවීම්කදී සලකනු ලැබේ ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ආ) (i) 2020 අංක 1 දරන ජාතික අයවැය චක්‍රලේඛය සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ උපදෙස් ඉල්ලා සිටින ලද්දේ ද;

(ii) එසේනම්, නීතිපතිවරයාගේ උපදෙස් මත ක්‍රියාමාර්ග ගන්නා ලද්දේ ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

230/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ—

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ දැව ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම දැව ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම දැව ආනයනය කළ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට දැව ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

732/2020

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) විදේශ රටකට භාණ්ඩ අළෙවිය සඳහා ඇති පහසුම ක්‍රමය "ඊ-කොමර්ස්" (E-Commerce) වෙබ් අඩවියක් හරහා සිදු කරන අළෙවිය වන බැවින් මේ සඳහා ලෝකයේ මිලියන 305ක පමණ ජනතාවක් "පේපැල්" (PayPal) "ගේට්වේ" (Gateway) භාවිතා කරන බවත්;

(ii) ශ්‍රී ලංකාවේ නිෂ්පාදන විදේශයන්ට අළෙවි කිරීමේ දී ඉහත ක්‍රමය භාවිතා කළ හැකි බවත්;

(iii) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එම ක්‍රමය ශ්‍රී ලංකාවේ විවෘත කර නොතිබීමෙන් භාණ්ඩයක්/සේවාවක් විදේශයන්ට අළෙවි කර, විදේශ විනිමය ලැබිය හැකි ආදායම් මාර්ග ඇහිරී ඇති බවත්;

(iv) ශ්‍රී ලංකාවේ ඇති "ඔන්ලයින්" (Online) ක්‍රමයට සේවා සපයන ආයතන, විදේශීය ලිපිනයන් භාවිතා කරමින්"පේපැල්" (PayPal) ගිණුම් සකස් කරන බවත්;

(v) මේ හේතුවෙන් ශ්‍රී ලංකාවට ලැබිය යුතු විශාල මුදලක්, කොමිස් වශයෙන් විදේශයන්ට ගෙවීමට සිදුව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ නිෂ්පාදන/සේවාවන් "ඔන්ලයින්" (Online) ක්‍රමයට විදේශයන්ට අළෙවි කිරීම සඳහා පවතින බාධාවන් ඉවත් කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

773/2020

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන ජාත්‍යන්තර පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ජාත්‍යන්තර පාසල් පිහිටුවීමේදී, ගුරුවරුන් බඳවාගැනීමේදී, ගාස්තු අයකිරීමේදී සහ වෙනත් කටයුතුවලදී එකී පාසල් නියාමනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

654/2020

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අදාළ දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුමතිය මත වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිති ඉඩම්වල හේන් වගාකිරීම සඳහා අවසර ලබා දීම සම්බන්ධයෙන් රජය තීරණයක් ගෙන තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම තීරණය මඟින් ආවරණය වන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් ප්‍රමාණය;

(ii) ඉහත ඉඩම් ප්‍රමාණය අතරින් හේන් වගා කිරීම සඳහා අවසර ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය;

(iii) මෙම තීරණය හේතුවෙන් එළිපෙහෙළි කරන අවශේෂ වනාන්තර ප්‍රමාණය;

හෙක්ටයාර්වලින් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

758/2020

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පිහිටි සුළු වාරිමාර්ග යටතට ගැනෙන වැව් හා අමුණු සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැව් හා අමුණු පිහිටා ඇති ප්‍රදේශ කවරේද;

(iii) ඒ අතරින් වැඩිම වැව් හා අමුණු සංඛ්‍යාවක් පිහිටා ඇති ප්‍රදේශය කවරේද;

(iv) ඉහත වැව් හා අමුණුවල ජල ධාරිතාවය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2015 සිට මේ වනතෙක් අලුත්වැඩියා කරන ලද දිස්ත්‍රික්කයේ පිහිටි එවැනි වැව් හා අමුණු සංඛ්‍යාව කොපමණද;

(ii) අලුත්වැඩියා කළ යුතු බවට හඳුනාගෙන ඇති වැව් හා අමුණු සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ අතරින් 2020 වර්ෂය තුළදී අලුත්වැඩියා කරනු ලැබූ වැව් හා අමුණු සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවායේ නම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

847/2020

ගරු වරුණ ලියනගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 වර්ෂයෙන් පසුව ශ්‍රී ලංකාවේ සිදු වූ ස්වභාවික විපත් හේතුවෙන් ආපදාවට පත් වූ පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් රජය මඟින් ලබා දෙනු ලබන ආපදා වන්දි ලබා දී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) එසේ ආපදා වන්දි ලබා දී නොමැති පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) ආපදා වන්දි ලබා දී නොමැති පවුල් සඳහා ආපදා වන්දි ලබාදීමට තවදුරටත් ගත වන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

853/2020

ගරු අජිත් රාජපක්ෂ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට සිටින ෆීල්ඩ් මාෂල් තනතුර දරන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් සහ ඔවුන් විශ්‍රාම යාමට නියමිත දින වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත එක් එක් ෆීල්ඩ් මාෂල්වරයාට ගෙවනු ලබන වැටුප් හා දීමනා, ලබා දී ඇති කාර්ය මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව, නිල වාහන සංඛ්‍යාව, නිල නිවාස සහ වෙනත් ප්‍රදානයන් වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

939/2020

ගරු මුජිබුර් රහුමාන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කරන ලද ස්වේච්ඡා සුභසාධක සංගම් පවතින බවත්;

(ii) එසේ ලියාපදිංචි කරන ලද ස්වේච්ඡා සුභසාධක සංගම්වල ලියාපදිංචිය අහෝසි කළ බව දන්වා එම දෙපාර්තමේන්තුව විසින් අදාළ සංගම්වලට ලිපි යොමු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) නිල වශයෙන් ලියාපදිංචි කරන ලද ස්වේච්ඡා සුභසාධක සංගම්වල ලියාපදිංචිය අහෝසි කිරීමේ පදනම කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

643/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඌව පළාතේ පිහිටි —

(i) තල්පිටිගල ජලාශ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතුවල ප්‍රමාදයට හේතු කවරේද;

(ii) 2015 වර්ෂයේදී මුල්ගල තබන ලද කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

(iii) හැඩ ඔය ජලාශ ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

648/2020

ගරු මයන්ත දිසානායක මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2018 දක්වා ශ්‍රී ලංකාවට පැමිණි විදේශීය සංචාරකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම සංචාරකයන්ගෙන් ශ්‍රී ලංකාවට ලැබුණු විදේශ විනිමය ප්‍රමාණය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මඟින් පවත්වාගෙන යනු ලබන සංචාරක නිකේතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටා ඇති ප්‍රදේශ කවරේද;

(iii) එම සංචාරක නිකේතනවල සේවය කරන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් ශ්‍රී ලංකාව තුළ නව සංචාරක නිකේතන ආරම්භ කර තිබේද;

(ii) එසේ නම්, එම සංචාරක නිකේතන කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

656/2020

ගරු චන්දිම වීරක්කොඩි මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සී/ස හබරාදුව විවිධ සේවා සමුපකාර සමිතිය මඟින් පාලනය වන ග්‍රාමීය බැංකුවේ මුදල් තැන්පත් කරන ලද තැන්පත්කරුවන්ගේ මුදල්, ආපසු නොගෙවීම සම්බන්ධයෙන් යම් ගැටලුකාරී තත්ත්වයක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙහිදී වංචා කර ඇති මුදල කොපමණද;

(ii) එකී තැන්පත්කරුවන්ට මේ වනවිට ගෙවා ඇති මුදල කොපමණද;

(iii) තැන්පත්කරුවන්ට තවදුරටත් ගෙවීමට ඉතිරි වී ඇති මුදල කොපමණද;

(iv) ඉතිරි තැන්පත්කරුවන්ගේ මුදල් ආපසු ගෙවන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එකී මුදල් වංචාවට අදාළ කාල වකවානුවල සිටි සභාපතිවරු ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ගේ නම් කවරේද;

(ii) එකී සභාපතිවරුන් ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට එරෙහිව ගෙන ඇති නීත්‍යානුකූල ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

780/2020

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) එවකට පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම් සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය යටතේ වවුනියාව ප්‍රදේශයේ ක්‍රියාත්මක වූ නිවාස යෝජනා ක්‍රමය යටතේ නිවාස අහිමි පුද්ගලයන්ට නිවාස ලබා දෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) වවුනියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වසම් 42 අතරින් නිවාස ලබා දීම සඳහා 2019 වර්ෂයේදී හඳුනාගෙන ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත එක් එක් ග්‍රාම නිලධාරි වසම සඳහා මේ වනතෙක් ලබා දී ඇති නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම නිවාසලාභීන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එක් එක් ග්‍රාම නිලධාරි වසම සඳහා නිවාස වෙන් කරන පදනම කවරේද;

(ii) කල්ලිකුලම් ග්‍රාම නිලධාරි වසමේ මුල් පදිංචිකරුවන්ට සහ පසුව පදිංචි කරවනු ලැබූ අයට නිවාස වෙන් කිරීමේදී පදනම් කර ගනු ලැබූ සාධක කවරේද;

(iii) එම නිවාස වෙන් කිරීමේදී පැන නැගී ඇති ගැටලුව විසඳීමට ගනු ලබන පියවර කවරේද;

(iv) මේ වනතෙක් නිවාස ලැබී නොමැති පුද්ගලයන්ට නිවාස ලබා දෙන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

861/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මන්නාරම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පල්ලිමුණෙයි සහ පරප්පාංකණ්ඩල් යන ගම්මානවලින් සහ නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වංකාලයි ගම්මානයෙන් ඉඩම් පවරාගැනීම හේතුවෙන් එම ප්‍රදේශවල ජීවත්වන ජනතාව විශාල අපහසුතාවයන්ට මුහුණදී ඇති බවත්;

(ii) 2019 වර්ෂයේදී වනජීවී අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉහත සඳහන් ගම්මානවලට පැමිණ මෙම ගැටලුව විසඳන බවට ජනතාවට පොරොන්දු වූ බවත්;

(iii) එසේ වුවද, ඉහත සඳහන් ගම්මාන තුනෙහි පදිංචි පොදු ජනතාවගේ ඉඩම් ගැටලුව මේ වනතෙක් විසඳී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ගැටලුව විසඳීම සඳහා පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

(iii) මෙම ගැටලුව විසඳීම සඳහා වැඩසටහන ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

33/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කුරගල පුරාවිද්‍යාත්මක ස්ථානය සංරක්ෂණය කිරීම සඳහා මේ වනවිට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

140/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ''සෞභාග්‍යයේ දැක්ම'' ප්‍රතිපත්ති ප්‍රකාශනය යටතේ අඩු ආදායම්ලාභී පවුල්වලට රැකියා ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වැඩසටහන යටතේ මේ වනතෙක් ලබා දී ඇති රැකියා සංඛ්‍යාව කොපමණද;

(ii) එම රැකියාලාභීන්ගේ නම් කවරේද;

(iii) එම වැඩසටහන තවදුරටත් ව්‍යාප්ත කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

234/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම වාහන ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම වාහන ආනයනය කළ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට වාහන ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

321/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ටේබල් ටෙනිස් ක්‍රීඩාව දියුණු කිරීම වෙනුවෙන් 2019 වර්ෂය සඳහා වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදලෙන් රජයේ පාසල් සඳහා වෙන් කළ මුදල කොපමණද;

(iii) අංක (i) හි සඳහන් මුදලෙන් පාසල් හැර ගිය දරුවන්ගේ ටේබල් ටෙනිස් ක්‍රීඩා කිරීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා වෙන් කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ටේබල් ටෙනිස් ක්‍රීඩාවෙන් ජාත්‍යන්තර ජයග්‍රහණ ලබා ගැනීම වෙනුවෙන් පාසල් ක්‍රීඩකයන් මෙහෙයවීම සඳහා සැලසුම් සකස් කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා ටේබල් ටෙනිස් සංගමය හා ඊට අනුබද්ධ අනෙකුත් සංගම්වල පරිපාලන හා සංවර්ධන කටයුතු සඳහා රජය සම්බන්ධ වන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා සම්බන්ධ වන ආකාරය කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

489/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ජාතික පාසල්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අවම ජාතික පාසල් සංඛ්‍යාවක් සහිත දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පිහිටි ජාතික පාසල් සංඛ්‍යාව ඉහළ දැමීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

565/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) කුරුණෑගල ශික්ෂණ රෝහල මඟින් විශාල සේවාවක් සිදු වන බව එතුමිය පිළිගන්නෙහිද?

(ආ) (i) එම රෝහලේ ඇති වාට්ටු සංඛ්‍යාව;

(ii) එම රෝහලේ පවතින ඇඳන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පැමිණෙන රෝගීන්ට ප්‍රමාණවත් සේවාවක් සැපයීමට අවශ්‍ය වන පහසුකම් කුරුණෑගල ශික්ෂණ රෝහලේ පවතින්නේද;

(ii) නොඑසේ නම්, එම අඩුපාඩු සම්පූර්ණ කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

593/2020

ගරු එස්.එම්.එම් මුෂාරෆ් මහතා,— වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඔලුවිල් වරාය ඉදිකිරීමෙන් පසු ප්‍රදේශයේ වෙරළ විශාල ඛාදනයකට ලක් වන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග කවරේද;
(ii) මේ තත්ත්වය වැළැක්වීමට වැලි යෙදීම වැනි තාවකාලික පියවර අනුගමනය කිරීමට හේතු කවරේද;
(iii) ඛාදනය වැළැක්වීමට ඉදිරියේදී ස්ථිර පියවර ගන්නේද;
(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) වරාය ඉදිකිරීමෙන් ඉඩම් අහිමි වූ ජනතාවට වරාය අධිකාරිය විසින් විකල්ප ඉඩම් ලබා දී නොමැති බවත් එතුමා දන්නෙහිද?

(ඈ) (i) එසේ නම්, ඔවුන්ට විකල්ප ඉඩම් ලබා දෙන දිනය;
(ii) ඉඩම් අහිමිවූවන් සඳහා වන්දි ලබා දෙන දිනය;
(iii) විකල්ප ඉඩම් ලබාදීමේදී සියලු දෙනාටම පර්චස් 20 බැගින් ඉඩම් ලබාදීමෙන් සිදුවූ වරද, නිවැරදි කරනු ලබන ආකාරය;
(iv) වරාය අධිකාරිය විසින් ඉදිකළ ඔලුවිල් කටාර් නිවාස යෝජනා ක්‍රමයේ පොදු කටයුතු සඳහා ඉඩම් වෙන් කර දෙන බවට වූ පොරොන්දුව ඉටු කරනු ලබන ආකාරය;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

598/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) යාපනය දිස්ත්‍රික්කයේ, වේලනෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ වේලනෙයි ප්‍රාදේශීය රෝහල පවතින බව එතුමිය දන්නෙහිද?

(ආ) එම රෝහල සඳහා ස්ථිර වෛද්‍යවරයෙක් පත් නොකිරීම හේතුවෙන් ප්‍රදේශයේ ජනතාව පීඩා විඳින බව එතුමිය පිළිගන්නෙහිද;

(ඇ) (i) එම රෝහල සඳහා අනුමත සේවක සංඛ්‍යාව කොපමණද;
(ii) එම රෝහල සඳහා මේ වනතෙක් ස්ථිර වෛද්‍යවරයෙක් පත් නොකිරීමට හේතු කවරේද;
(iii) ජනතාවට ප්‍රශස්ථ වෛද්‍ය සේවාවක් ලබා දීම සඳහා වේලනෙයි ප්‍රාදේශීය රෝහලේ මේ වනවිට පවතින කාර්ය මණ්ඩල පුරප්පාඩු පුරවනු ලබන දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

611/2020

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ප්‍රදේශයේ, ''මහනුගලන්ද වත්ත'' නමින් අක්කර 85ක පමණ විශාලත්වයෙන් යුතු සශ්‍රීක පොල් ඉඩමක් තිබූ බවත්;
(ii) එය මහා භාරකාර දෙපාර්තමේන්තුවට අයත්ව තිබූ ඉඩමක් බවත්;

(iii) එය භාරයකට අයත්ව තිබූ ඉඩමක් බවත්;

(iv) මෙම ඉඩම වොක්ස්වැගන් මෝටර් රථ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීම සඳහා "වෙස්ටර්න් ඔටෝ මොබයිල්" ("Western Auto Mobile") නමැති සමාගමකට ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සමාගමට මෙම ඉඩම ලබා දී ඇති පදනම සහ කාලසීමාව කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ඉඩමෙන් කපා ඉවත් කරන ලද පොල් ගස් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පොල් ගස් අළෙවි කර ඇති පදනම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

638/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකළපුව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රෝහල්වල මේ වනවිට සේවය කරන වෛද්‍යවරුන් සංඛ්‍යාව අවශ්‍ය ප්‍රමාණය වඩා සියයට දහයක් පමණ අඩු බවත්;

(ii) එම රෝහල්වල විශේෂඥ වෛද්‍යවරුන්ගේද හිඟයක් පවතින බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) ඉහත රෝහල්වල පවතින වෛද්‍ය පුරප්පාඩු පිරවීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

772/2020

ගරු මුජිබුර් රහුමාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කොළඹ නාගරික සීමාව තුළ පිහිටි ජාතික පාසල්වල පළමු ශ්‍රේණියට ඇතුලත් වීමට අඩු පහසුකම් සහිත නාගරික ළමුන්ට නොහැකි වන තරම් බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, කොළඹ නගර සහා සීමාව තුළ පිහිටි ජාතික පාසල් සම්බන්ධයෙන්;

(i) පාසල්වල නම් කවරේද;

(ii) ආගමික හා ආගමික නොවන ලෙස වර්ගය කවරේද;

(iii) අධ්‍යයන මාධ්‍ය අනුව පාසල් සංඛ්‍යාව සහ සිංහල හා දෙමළ මාධ්‍යට වෙන්කර ඇති පංති සංඛ්‍යාව කොපමණද;

(iv) ත්‍රයිභාෂා ජාතික පාසල්වල 1 සිට 5 දක්වා ශ්‍රේණිවල දෙමළ මාධ්‍ය පංතිවල ඉගෙනුම ලබන ළමුන් සංඛ්‍යාව කොපමණද;

(v) භාෂා මාධ්‍ය, ජාතිය හා ආගම පදනම් කර ගනිමින් එක් එක් පාසල්වලට ඇතුලත් කර ගන්නා සිසුන් සංඛ්‍යාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) පළමු ශ්‍රේණියට ළමුන් බඳවාගැනීමේ පවතින ක්‍රියාවලිය පිළිබඳව රජය තෘප්තිමත් වන්නේද;

(ii) පරම්පරා ගණනාවක් පාසැල් ආසන්නයේ ජීවත් වන දෙමාපියන්ගේ ළමුන් සඳහා විශේෂ කෝටා ක්‍රමවේදයක් හඳුන්වාදීම මඟින් විවිධ ජාතික, ආගමික හා සමාජ පසුබිමක් සහිත සිසුන් වැඩි සංඛ්‍යාවකට අවස්ථාව ලබා දෙන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

774/2020

ගරු කිංස් නෙල්සන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පිහිටි මධ්‍යම රජයට සහ පළාත් සභාවට අයත් පාසල් අතරින් ගුරු හිඟය පවතින, පානීය ජල පහසුකම්, වැසිකිළි පහසුකම්, විද්‍යාගාර, පුස්තකාල සහ ක්‍රීඩා පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම දිස්ත්‍රික්කයේ ඉහත අඩුපාඩුකම් සහිත පාසල් සංවර්ධනය කිරීමට රජය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර ගැනීමට ගතවන කාලය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

781/2020

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වර්ෂ 2005 සිට 2015 දක්වා එවකට ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම්, පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන හා තරුණ කටයුතු අමාත්‍යාංශය වෙත පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීමේ කටයුතු වෙනුවෙන් විවිධ රටවලින් සහ ආයතනවලින් ලැබුණු හා මිලදී ගත් වාහන වර්ග, ඒවායේ ලියාපදිංචි අංක සහ ඒවා භාවිතය සඳහා ලබා දෙන ලද රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වෙන් වෙන් වශයෙන්;

(ii) එම වාහනවල වත්මන් ක්‍රියාකාරිත්වය;

(iii) මේ වනවිට එම වාහන භාවිතා කරනු ලබන ආයතන;

(iv) මේ වනවිට තලෙයිමන්නාරම පොලිසියේ රඳවා ගෙන ඇති WP RB - 2639 ලියාපදිංචි අංකය දරන ට්‍රැක්ටර් රථය භාවිතා කරන ලද අමාත්‍යාංශය හා එහි අදාළ අංශය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2009 සිට 2012 දක්වා මැණික් ෆාම් අතරමැදි කඳවුරෙහි භාවිතා කළ වාහනවල වර්ග හා ලියාපදිංචි අංක;

(ii) මේ වනවිට එම වාහන භාවිතා කරනු ලබන ආයතනය හා ස්ථානය;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

862/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වවුනියාව, මුලතිව්, මන්නාරම යන දිස්ත්‍රික්කවල පිහිටි කෘෂිකාර්මික වැව් ප්‍රතිසංස්කරණය කිරීමටත්, ගොවීන්ට අයත් කෘෂිකාර්මික ඉඩම් එළි පෙහෙළි කිරීමටත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බාධා කරමින් සිටින බවත්;

(ii) මන්නාරම දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ තීරණය පරිදි, මන්නාරම දිස්ත්‍රික්කයේ, මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කායාක්කුලි ගමට ආසන්නව පිහිටා ඇති අක්කර 20ක ඉඩම ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාවට පැමිණි ජනතාව නැවත පදිංචි කරවීම සඳහා ලබා දෙන මෙන් ඉල්ලා වන සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්වරයාට ලිපියක් යොමු කර මේ වනවිට වර්ෂ දෙකක් පමණ ගත වී ඇතත්, එම ඉල්ලීම මේ වන තෙක් ඉටුවී නොමැති බවත්;

එතුමා දන්නෙහිද ?

(ආ) එසේ නම්, එම ඉඩම ඉහත සඳහන් කාර්යය සඳහා ලබා දීම සඳහා පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

882/2020

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2019 වර්ෂයේදී රාජ්‍ය විශ්වවිද්‍යාල සහ රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල වෙනුවෙන් වැය කරන ලද මුළු මුදල වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය කඩිනම් කිරීමේ (AHEAD) ව්‍යාපෘතිය යටතේ ප්‍රදානය කරන ලද ලෝක බැංකු ණය මුදලෙහි සම්පූර්ණ වටිනාකම කොපමණද;

(ii) ලෝක බැංකු ණය හරහා උසස් අධ්‍යාපනය වෙනුවෙන් වැය කරන ලද රජයේ වියදම් ප්‍රතිශතය කවරේද;

(iii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ප්‍රතීතනය කරන ලද පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන වෙත වෙන් කරන ලද ණය ප්‍රතිශතය කවරේද;

(iv) උක්ත ව්‍යාපෘතිය යටතේ සේවය කිරීම පිණිස ද්විතීයන පදනමෙන් අනුයුක්ත කරන ලද අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් උසස් අධ්‍යාපන අංශයෙහි සේවක සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

614/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කලා වැව සිට තිසා වැව දක්වා ජලය ගෙන යන පරණ යෝධ ඇළ සැල්වීනියා වැනි ජලජ පැළෑටිවලින් වැසී ඇති බවත්;

(ii) මෙම තත්ත්වය ඇළ මාර්ගය ඔස්සේ ජලය ගලා යෑමට බාධාවක් වී ඇති බවත්;

(iii) මේ පිළිබඳව අදාළ නිලධාරීන් කිහිපවරක් දැනුම්වත් කළද, මේ වනතෙක් කිසිදු විසඳුමක් ලැබී නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉදිරි වගා කටයුතු සඳහා ජලය බෙදා හැරීමට පෙර ඉහත සඳහන් ජලජ පැළෑටි ඉවත් කිරීමට යම් ක්‍රියාමාර්ගයක් ගන්නේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ගය ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

855/2020

ගරු නලින් ප්‍රනාන්දු මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 අගෝස්තු 31 දිනට සීමාසහිත ලංකා සතොස ආයතනයේ පාරිභෝගික භාණ්ඩ තොගවල දළ වටිනාකම කොපමණද;

(ii) 2020 ජනවාරි 01 දින සිට 2020 අගෝස්තු 31 දින දක්වා එක් එක් මාසයේ මාසික ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2020 අගෝස්තු මස 31 දිනට සැපයුම්කරුවන්ට ගෙවීමට තිබූ මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2020 අගෝස්තු මස 31 දින වනවිට සීමාසිහිත ලංකා සතොස ආයතනය තුළ තිබූ කල් ඉකුත් වූ භාණ්ඩවල වටිනාකම කොපමණද;

(ii) එම භාණ්ඩ සම්බන්ධයෙන් ආයතනය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

857/2020

ගරු ජගත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා හා මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ දිළිඳුකම පිටු දැකීමේ ප්‍රධානතම ව්‍යාපාරය සමෘද්ධි ව්‍යාපාරය වන අතර එය දිළිඳුභාවය පිටු දැකීමට විශාල කාර්යභාරයක් ඉටු කර ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ පිහිටා ඇති සමෘද්ධි බැංකු සංඛ්‍යාව කොපමණද;

(ii) එම බැංකුවල තැන්පත් කර ඇති අරමුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එම අරමුදල් ප්‍රමාණය අදාළ ගිණුම් අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පසුගිය රජයේ දේශපාලන ප්‍රතිරූපය ගොඩනගා ගැනීම සඳහා අඩු ආදායම්ලාභින් විසින් සමෘද්ධි ව්‍යාපාරය තුළ තැන්පත් කර තිබූ විශාල මුදලක් යොදාගෙන ඇති බව දන්නේද;

(ii) එසේ නම්, අවභාවිතා කර ඇති මුදල කොපමණද;

(iii) එම මුදල් යොදා ගනු ලැබූ කාර්යයන් සහ එම මුදල් අයත්වන අරමුදල් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම මුදල් අවභාවිතා කිරීමට සම්බන්ධ වූ පුද්ගලයන් කවරේද;

(v) ඔවුන්ට එරෙහිව නීතිමය පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

866/2020

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාතේ අධ්‍යාපන කලාප අතරින් ගුරු අතිරික්තයක් පවතින අධ්‍යාපන කලාපවල නම් කවරේද;

(ii) එම අතිරික්ත ගුරුවරුන් සංඛ්‍යාව එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නැගෙනහිර පළාතේ අධ්‍යාපන කලාප අතරින් ගුරු හිඟයක් පවතින අධ්‍යාපන කලාපවල නම් කවරේද;

(iv) එම හිඟ ගුරුවරුන් සංඛ්‍යාව එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මේ වනවිට නැගෙනහිර පළාත් සභාව ක්‍රියාත්මක නොවන අතර එම පළාත් සභාවේ පරිපාලනය සෘජුවම අදාළ ආණ්ඩුකාරවරයා යටතේ ක්‍රියාත්මක වන බැවින් නැගෙනහිර පළාතේ ගුරු සමතුලිතයක් ඇති කිරීමට අමාත්‍යාංශය විසින් කඩිනම් පියවර ගන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

943/2020

ගරු මයන්ත දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ පවතින රැකියා වියුක්ති අනුපාතය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම රැකියා වියුක්තිය සඳහා ලබා දෙනු ලබන විසඳුම් කවරේද;

(iii) එම විසඳුම් ලබා දීම තුළින් සපුරා ගැනීමට අපේක්ෂිත ඉලක්ක කවරේද;

(iv) එම ඉලක්ක සපුරා ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

721/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මන්නාරම දිස්ත්‍රික්කයේ, නානාට්ටාන් ප්‍රදේශයේදී නව නිවසක් ඉදිකිරීම සඳහා 2020.02.18 දින අත්තිවාරමක් කැපීමේදී පෞරාණික වටිනාකමින් යුත් කාසි හමුවී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එහිදී හමුවී ඇති කාසි සංඛ්‍යාව කොපමණද;

(ii) එම කාසි අයත්වන යුගය කවරේද;

(iii) එම කාසි පරිහරණය කරන ලද කාලයේදී පැවති පාලනය කවරේද;

(iv) එම කාසිවල සටහන්ව ඇති මත්ස්‍ය හා කඩුව සංකේතයන් සහ එම කාසි පරිහරණය කරන ලද සමයේදී පැවති පාලනය අතර පැවති සම්බන්ධය කවරේද;

(v) එම කාසිවල පවතින පෞරාණික වටිනාකම පිළිබඳ කරුණු ඉතිහාසය විෂය නිර්දේශයට ඇතුළත් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

863/2020

ගරු මනූෂ නානායක්කාර මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020.01.01 සිට 2020.10.10 දක්වා ශ්‍රී ලංකාවට පැමිණි විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ශ්‍රමිකයන් පැමිණි රටවල්වල නම් කවරේද;

(iii) ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා මේ වනවිට ලියාපදිංචි වී සිටින විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ශ්‍රමිකයන් සේවය කරනු ලබන රටවල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(ii) එම ශ්‍රමිකයන් නිරෝධායන කිරීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iii) එම ශ්‍රමිකයන් නිරෝධායනය කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා ඇවන්ට්ගාඩ් (Avant Garde) ආයතනයට ලබා දී තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා අනුගමනය කර ඇති ක්‍රමවේදය කවරේද;

(v) එක් ශ්‍රමිකයකු නිරෝධායනය කිරීම සඳහා ඇවන්ට්ගාඩ් ආයතනය විසින් අය කරනු ලබන මුදල කවරේද;

(vi) ඇවන්ට්ගාඩ් ආයතනය විසින් මේ වනවිට නිරෝධායනයට යොමු කර ඇති ශ්‍රමිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

878/2020

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගේ ඇසීමට,— (1)

(අ) (i) දහනවවන ශත වර්ෂයේ මුල් භාගයේ දී ශ්‍රී ලංකා රජයෙහි සිවිල් අංශය සහ හමුදා අංශය ලෙස බෙදා දැක්වීමක් සිදු කරන ලද අවස්ථාවේ සිට ශ්‍රී ලංකාවේ රජය තුළ සිවිල් අංශයෙහි සාමාජිකයන් හමුදාමය අංශයටත් හමුදා අංශයෙහි සාමාජිකයන් සිවිල් අංශයටත් විධිමත් ලෙස පත් කරනු ලැබීමක් සිදුකොට තිබේ ද;

(ii) 2019.11. 17 දින සිට සන්නද්ධ හමුදාවල සේවය කරන කිසියම් සාමාජිකයන් සිවිල් තනතුරුවලට පත් කරනු ලැබ තිබේ ද;

(iii) එසේනම්, එම එක් එක් තැනැත්තාගේ නම් කවරේද;

(iv) ඔවුන් සිවිල් තනතුරුවලට පත් කිරීම සාධාරණීකරණය කරනු ලබන හේතුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) සන්නද්ධ හමුදාවල සේවය කරන සාමාජිකයන් සිවිල් තනතුරුවලට පත් කිරීමේ මෙම ප්‍රතිපත්තිමය වෙනස අමාත්‍ය මණ්ඩලය තුළ සාකච්ඡා කරනු ලැබුවේ ද;

(vi) ශ්‍රී ලංකා පරිපාලන සේවය , ශ්‍රී ලංකා සැලසුම් සේවය, රජයේ වෛද්‍ය සේවය, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය ආදිය තුළ අඩංගු සිවිල් සේවා තනතුරුවල රාජකාරි ඉටු කිරීම සඳහා හැකියාවන් ඇති නිලධාරීන් නොමැත්තේ ද;

(vii) එසේනම්, ඉහත කී සේවාවන් අඛණ්ඩව පැවතීමේ කිසියම් ප්‍රයෝජනයක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද ?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

940/2020

ගරු මුජිබුර් රහුමාන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සියලුම ග්‍රාම නිලධාරි වසම් ආවරණය වන පරිදි අඩු ආදායම්ලාභී පවුල්වලට නිවාස ඉදිකර දීමේ වැඩසටහනක් අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන ග්‍රාම නිලධාරි වසම්වල නම් කවරේද;

(iii) කුලී නිවාසවල පදිංචිව සිටින පවුල් සඳහාද ඉහත වැඩසටහන ක්‍රියාත්මක කරන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?